ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය
இலங்கையின் பிரதம அமைச்சர்
Prime Minister of Sri Lanka

# නිදහස් දින පණිවුඩය

සදාචාරසම්පන්න දේශයක් ලෙස අප රට ඔසවා තබමින් “එකම දැයක් - මහ බලයක්” තුළ සමස්ත ජනතාව එක්සත් කරමින් 68 වැනි නිදහස් දිනය සමරන්නට ලැබීම අප ලද ජයග්‍රහණයකි.

යටත්විජිත භාවයෙන් රට මුදාගන්නට සියලු ජනකොටස් ඒකරාශී කර පෙරමුණ ගත්තා සේම, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්, හිමිකම් මර්දනය කරමින්, ජාත්‍යන්තරය තුළ රට අපකීර්තියට පත්වෙමින් පැවති අඳුරු වකවානුවක ඒකාධිපතිවාදයෙන්, පවුල්වාදයෙන් රට මුදාගැනීමට අපි පෙරමුණ ගෙන කටයුතු කළෙමු. පසුගිය වසරේ ජනවාරි 08 වැනි දා ලැබූ ජයග්‍රහණය එහි විශිෂ්ඨතම ප්‍රතිඵලයකි.

ඒ දිනාගත් නිදහස වඩාත් තිරසර, අර්ථසම්පන්න නිදහසක් බවට පත් කරගැනීමේ වගකීම දැන් අප සැම සතු ය. ඒ සඳහා ජාති, ආගම්, පක්ෂ පාට භේදයකින් තොරව සමස්ත ශ්‍රී ලාංකීය ජනතාව සමඟ අත්වැල් බැඳගෙන කටයුතු කිරීම වත්මන් රජයේ අපේක්ෂාවයි.

ජාත්‍යන්තරය ඉදිරියේ මානව හිමිකම් සුරකින, නිදහස් ගෞරවනීය රටක් ලෙස අපි නැවතත් අපගේ අනන්‍යතාව තහවුරු කරගනිමින් සිටිමු. නීතිය, සාමය හා සංහිඳියාව සුරකිමින්, දියුණු සමාජ ආර්ථික පරිසරයක් රට තුළ ගොඩනැංවීමේ භාරදූර කර්තව්‍යය ද අප ඉදිරියේ ඇත.

මේ සමස්ත ක්‍රියාදාමය තුළ තම භූමිකාව මැනවින් අවබෝධ කරගනිමින් දේශයේ දියුණුව උදෙසා සැබෑ පුරවැසියන් සේ කැපවීමට මෙම නිදහස් දිනයේ දී විශේෂයෙන් අදිටන් කරගනිමු.

**රනිල් වික්‍රමසිංහ**
*අග්‍රාමාත්‍ය*

2016 ජනවාරි 21